## ව්‍යාපාරී නීති

පොළිය ගෙවීමට හෝ මේ ගොවියාට නුපුළුවන. ඒ හේතුව නිසා ඔව්හු සදාකාලිකවම ණය කරුවන් වී සිටින බව අපි දනිමු. සිංහල පමණක් දත් නූගත් ගොවියාත් ඇතැම්විට ඉංග්‍රීසියෙන් තම කටයුතු කරනු ලබන උගත් යයි කියා ගන්නා ඉහත කී අධ්‍යක්ෂකවරයාත් අතර කිසි වෙනසක් නැති බව අපට දැන් පැහැදිලිය.

මේ උදාහරණ කල්පිත ඒවා නොවන බවත්, සමාගම් අධ්‍යක්ෂකවරුන්ගේ සහ ගොවියන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව මා පුද්ගලික අත්දැකීම් වලින් උකහා ගත් කරුණු බවත් සඳහන් කළ යුතුය. මෙයින් අපට තේරුම් යන්නේ සමාගම් අධ්‍යක්ෂකවරයා මූල්‍ය කළමනාකරණය ගැන ඉතා ඉහළ දැනීමක් යුක්ත අයෙකු විය යුතු බවයි.

භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රාග්ධනය, භූමිය , ශ්‍රමය, ව්‍යවසාය යන කරුණු 04 අවශ්‍ය බව ආර්ථික විද්‍යා මුල් පාඩම් වල අපි ඉගෙනගෙන සිටිමු. ව්‍යවසාය යනු කොටසේ වෙළඳපොළ පිළිබඳව යම් අදහසක් තිබුණද, අතීතයේ ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු නොවන බව අප පිළිගත යුතුය. එහෙත් අද වෙළෙඳපොළ මූල්‍ය කළමනාකරණය තරම්ම වැදගත් සාධකයක් බව අප පිළිගත යුතුව ඇත.

තුනී ලැලි අවශ්‍යතාවය ප්‍රධාන වශයෙන් මතුවූයේ තේ කර්මාන්තය සඳහාය. තේ පෙට්ටිවලට අවශ්‍ය තුනී ලැලි නිෂ්පාදනය කළේ ගිංතොටය. ගිංතොට මේ කර්මාන්තය ස්ථාපිත කිරීමේ ප්‍රධාන තර්කය වූයේ ගිං ගඟ ඇසුරුකොට ගෙන ප්‍රවාහනය කිරීමේ පහසුවයි. පැරණි වාර්තා පරීක්ෂා කර බැලුවහොත් ගඟෙන් ප්‍රවාහනය කරනවාට වඩා පහසු මිලට රජයේ ලොරි වලින් ද ඊටත් වඩා අඩු මිලට පුද්ගලික ලොරි වලින්ද කරගත හැකි බව දැකිය හැකිය. එසේම මෙම කර්මාන්ත ශාලාවේ නිමි භාණ්ඩය වන තේ පෙට්ටි අවශ්‍ය වූයේ උඩරටටය. ඒවා ප්‍රවාහනය කිරීමේදී නිමි භාණ්ඩයට හානි සිදුවූ බවත් වාර්තා ගතය. එදා තම නිෂ්පාදනය සහ වෙළෙඳපල ගැන තිබූ අවබෝධය කොතරම් දුරට එවැනි ව්‍යාපාර වලට බලපා ඇත්දැයි අප හොඳින් දනිමු.

ඇතැම් විට සමාගම් අධ්‍යක්ෂ වරයා ඒ නමින්ම හඳුන්වන්නේ නැත. සමාගම් පනතේ 194 ( 6 ), 195 (4), 198 (10) සහ 404 (ආ) වගන්ති වල සඳහන්ව ඇත. ඇතැම් විට නිලධාරියා යන යෙදුමෙන්ද හැඳින්විය හැක. එහෙත් අධ්‍යක්ෂකවරයා සමාගමේ සේවකයෙකු නොවන බව පැහැදිලිව සඳහන් වේ. හේතුව ඔහුට සමාගම ඇවර කිරීමේදී සමානුපාතික ගෙවීමක් ලැබීමට අයිතියක් නැති නිසාය. එහෙත් තම සේවා කාලය තුළ තමාගේ සේවය වෙනුවෙන් ගෙවීමක් ලැබීමට ඔහුට නෛතික අයිතියක් ඇති බව Craven Ellis Vs Canons ltd. (1936) නඩුවේදී ඇපල් උසාවිය තීරණය කර ඇත. එසේම මෙම ගෙවීම සිදු වන්නේ අධ්‍යක්ෂකවරයා සහ සමාගම අතර ඇති කර ගත් ගිවිසුමේ ප්‍රකාර බව Re Richmond Galle Property Company, 1965 නඩුවේදී තීරණය වී ඇත.

මේ අනුව ගෙවීමක් කොට ගුණාත්මක අගයකින් යුත් අධ්‍යක්ෂකවරයෙකු සේවයට ගැනීමට සමාගමකට ඉඩ ඇත.

ඩෙනිං සාමිවරයාගේ අදහසකට අනුව අධ්‍යක්ෂක වරයා රාජකාරී නිසිලෙස කිරීම සඳහා වෘත්තීය මග පෙන්වීමක් කළ යුතුය. එම අවස්ථාවේදී ඔහු තම සේවාව ලබා ගන්නා සේවා දායකයෙකු ලෙස පමණක් නොව සමාගම කරදරයකින් බේරා ගන්නා අයෙකු ලෙසත් ක්‍රියා කළ යුතුය.

එසේනම් සමාගම් අධ්‍යක්ෂකවරයා කොතරම් දුරට මූල්‍ය කළමනාකරණය සහ වෙළෙඳපල ගැනත් පෞද්ගලික වගකීමක් දැරිය යුතුද යන්නත් මෙයින් අපට පැහැදිලිය.


### කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් කර්මාන්ත අංශයට සැලසෙන ග්‍රැෆික් මෝස්තර සේවාව

ග්‍රැෆික් මෝස්තර අනුව ඇසුරුම් සැකසීම, භාණ්ඩ අලෙවිය නංවාලීම කෙරෙහි සැහෙනදුරට බලපාන්නකි. ලේබල් හා ඇසුරුම් සැලසුම්කර ඇති අන්දම සහ ප්‍රචාරක ක්‍රම ආදිය භාණ්ඩයක් කෙරෙහි පාරිභෝගිකයාගේ සිත කිසියම් ප්‍රමාණයකට ඇදගැනීමට උපකාර වේ.

මෙවැනි කටයුතු ඉටු කරන වානිජ්‍ය ව්‍යාපාර හා සංවිධාන කොතෙකුත් ඇතත්, ඒ සඳහා ඔවුන් අයකරන ගාස්තු ඉතා අධික හෙයින් සෑම කර්මාන්ත හිමියෙකුටම මේවා ලබා ගැනීමේ හැකියාවක් නැත.

කුඩා හා මධ්‍ය පරිමාණ සුළු කර්මාන්තකරුවන්ට මෙම අංශයෙහිලා සහනයක් සැලසීමේ අරමුණ ඇතිව ග්‍රැෆික් මෝස්තර අනුව, ලේබල් , ප්‍රචාරක දැන්වීම් ඇසුරුම් සකසාදීම සහ ප්‍රචාරක මෝස්තර සැපයීමේ සේවාවන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ආරම්භ කොට ඇත. ඒ සඳහා අයකරනු ලබන්නේ අමුද්‍රව්‍යවල මිලට සරිලන සහනදායී සුළු ගාස්තු මුදලකි. මේ සඳහා වැඩි විස්තර ලබා ගැනීමට විමසන්න.

**අධ්‍යක්ෂ**
**කාර්මික තාක්ෂණ තොරතුරු සේවා අංශය**
615, **ගාලු පාර, කටුබැද්ද, මොරටුව.**
**දුර.** 011 - 2605372.